# ඇස් ලොකු බණ්ඩා



W. මනුදි රිත්මලී වීරපටබැදි

ඇස් ලොකු බණ්ඩා

2023

කතෘ ප්‍රකාශනයකි

ISBN 978-624-206-887-9

කතාව සහ චිත්‍ර:

W. මනුදි රිත්මලී වීරපටබැදි

2 ශ්‍රේණිය E

මහාමායා බාලිකා විදුහල

2023.11.15

කතෘගේ වෙනත් කෘති

- කැලෑ ගමේ සෙල්ලම් ඉස්කෝලේ
- සමනල පැංචිගේ මල් නැති වෙලා
- අශ්ව පැටියගේ අලුත් යාලුවා
- කොළ පාට එළිය

**පිදුම**

මට අකුරු කියවූ අත්තාටත්

අකුරු ලියවූ ගුරුතුමියටත්

ආදරයෙන් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන එවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර


විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

2023.11.15



දවසක් මාමා මට සෙල්ලම් බඩුවක් ගෙනත් දුන්නා. එයා පැන්ඩෙක්. එයා සුදුයි කලුයි. එයාගේ ඇස් දෙක ගොඩක් ලොකුයි. නිල්පාටයි. අක්කයි මමයි එයාට දාන්න නමක් හිතුවා. ඒත් හරියන නමක් මතක් වුණේ නෑ.



අපි අත්තලගේ ගෙදර යද්දි මම එයාව අරගෙන ගියා. අත්තා එයාට නමක් දැම්මා "ඇස් ලොකු බණ්ඩා" කියලා. එදා ඉදලා හැමෝම එයාට කිව්වේ ඇස් ලොකු බණ්ඩා කියලා.

එයා තමයි හැමවෙලේම මගේ තනියට ඉන්නේ. දවසක් මම එයාව හොයනවා හොයනවා එයා නෑ.

මට ගොඩක් දුක හිතුනා. මම හයියෙන් ඇඬුවා. ගෙදර හැමෝම එයාව හෙව්වත් හම්බ වුණේ නෑ.



දවසක් මමයි අක්කයි අත්තගේ කාර් එක ඇතුලේ සෙල්ලම් කර කර හිටියා. පිටි පස්සෙ සීට් එකේ ඉඳල එබිලා බලද්දි මම දැක්කා කාර් එකේ

ඩිකියේ ඇස් ලොකු බණ්ඩා හිර වෙලා හිටියා.

මම සතුටින් කෑ ගැහුවා. අම්මයි අක්කයි අත්තයි දුවගෙන ආවා. අපි ඇස් ලොකු බණ්ඩා එළියට ගත්තා.



අපි අත්තලගේ ගෙදර නිවාඩු කාලය සතුටින් ගත කළා. එළියේ ගස් අස්සේ සෙල්ලම් කළා. අඹ ගස් දෙකක් අතරේ අම්මාගේ පරණ සාරියක් ගැටගහලා තොටිල්ලක් හැදුවා. ඒකේ අපි දෙන්නත් නැලවුනා. ඇස් ලොකු බණ්ඩාත් නැලෙව්වා.



නිවාඩු කාලය ඉවර වුණා. අපි ආපහු එන්න ලෑස්ති වුණා. ඇස් ලොකු බණ්ඩා ආයෙත් නැතිවෙලා. අම්මයි, අත්තයි, අක්කයි, මමයි එයාව හැමතැනම හෙව්වා. ඇඳවල් යට බැලුවා. කාර් එක ඇතුලේ බැලුවා. කොහෙවත් එයා හිටියේ නෑ. එයා නැතුව යන්න බෑ කියලා මම හොඳටම ඇඬුවා. අත්තා කිව්වා අපි ගියාට පස්සෙ එයාව හම්බුනොත් තැපෑලෙන් එවන්නම් කියලා. අපි ගෙදර ආවා.



මම හැමදාම අත්තට කතා කරලා අහනවා ඇස් ලොකු බණ්ඩා හම්බුනාද කියලා. අත්තා නෑ කිව්වම මට ගොඩක් දුක හිතෙනවා. දවසක් අත්තා කතා කරලා කිව්වා උණුසුම් පුවතක් තියෙනවා කියලා.



මම මොකක්ද කියලා ඇහුවම අත්තා කිව්වා ඇස් ලොකු බණ්ඩා හම්බුනා කියලා. මට ගොඩක් සතුටු හිතුනා. එයා ඉඳලා තියෙන්නේ අපි හදපු සාරි තොට්ල්ලේ.



මම එයාව නිදි කලාට මටම එයාව ගන්න අමතක වෙලා. එයා වැස්සට තෙමිලා පුස් කාලා. අත්තා කිව්වා එයාව හෝදන්නම් කියලා.

එතකොට ආයෙත් නිවාඩු දෙන්න ළං වෙලා තිබුනේ. මට අත්තලාගේ ගෙදර යනකම් ඉවසිල්ලක් නැතුව හිටියේ ඇස් ලොකු බණ්ඩා බලන්න. එයා අතට ගත්තම මට හිතුනා එයා ටිකක් කෑත වෙලා කියලා.



ඒ උනාට එයා තමයි තාමත් මම කැමතිම සෙල්ලම් බඩුව. මම ආයෙ කවදාවත් එයාව නැති කරගන්නේ නෑ.





## පසවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණී මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20

ISBN 978-624-206-887-9